මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| | | 2023.02.22 |

චක්‍රලේඛ අංකය : DFD/ 2023-1 (I)

ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්

## 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන සඳහා අධීක්ෂණ කමිටු පත් කිරීම

2022/2023 මහ කන්නයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්/සමුපකාර සමිති හරහා වී මිලදී ගැනීමේ සහ වී තොග සහල් කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක DFD/ 2023-1 මඟින් ලබාදෙන ලද උපදෙස්වලට අමතර වශයෙනි.

2.0 මෙම වැඩසටහන මාස දෙකක පමණ කෙටි කාලයක් තුළ දිවයින පුරා ක්‍රියාත්මක කළ යුතුව ඇති බැවින් හා වඩාත් විනිවිදභාවයකින් යුක්තව ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය බැවින්, ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම්වලින් වැඩසටහන අධීක්ෂණය සහ පසු විපරම සඳහා කමිටු පත් කිරීමට 2023.02.14 දින ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග පහත සඳහන් පරිදි වේ.

2.1 ජාතික මට්ටමේ කමිටුව

2023.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම වැඩසටහන අධීක්ෂණය සඳහා කෘෂිකර්ම අමාත්‍යවරයා, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා යන අමාත්‍යවරුන්ගෙන් සමන්විත ජාතික කමිටුවක් පත්කරන ඇත. තවද, මෙම කමිටුව සඳහා නිරීක්ෂකයින් ලෙස 2023.02.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශෙහාන් සේමසිංහ මැතිතුමා, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා හා අනුප පස්කුවල් මැතිතුමා යන රාජ්‍ය අමාත්‍යවරුන් තිදෙනාද පත් කර ඇත.

ඊට අමතරව, 2023.02.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙම වැඩසටහන කඩිනම්ව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම පහසුකරලීම සඳහා පහත නිලධාරින්ගෙන් සමන්විත ජාතික කමිටුවක් ද පත්කර ඇත.

i. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු (සභාපති)
ii. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
iii. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු

iv. වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
v. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මෙම වැඩසටහනට අදාළ නිලධාරින්ගෙන් සමන්විත ජාතික කමිටුවට ජනාධිපති ලේකම්තුමා විසින් අධීක්ෂණ කමිටු පත්කිරීම සම්බන්ධයෙන් ලබාදුන් උපදෙස් පරිදි පහත නිලධාරින්ද ඇතුළත් කර ඇත.

i. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
ii. ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු
iii. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
iv. සභාපති, වී අලෙවි මණ්ඩලය

3.0 දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු සඳහා පහත පරිදි නිලධාරීන් යෝජනා කර ඇති බැවින් එම කමිටු විධිමත් අන්දමින් පත්කිරීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් හා අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් සිදුකළ යුතු වේ.

3.1 <u>දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන කමිටුව</u>

වී මිලදී ගැනීම මෙන්ම සහල් බෙදාදීම පිළිබඳව (ඉදිරි සති 08 තුළ සතිපතා රැස්වී අදාළ තීරණ ගැනීම සඳහා) පහත නිලධාරින්ගෙන් සමන්විත දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචන කමිටුව පත් කිරීම.

i. දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති
ii. දිස්ත්‍රික් ලේකම්/දිසාපති
iii. පළාත් කෘෂිකර්ම ලේකම්
iv. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
v. ගොවිජන සේවා සහකාර කොමසාරිස්
vi. සමෘද්ධි හා පෝෂණ වැඩසටහන් සහකාර දිස්ත්‍රික් ප්‍රධානීන් හා සෞඛ්‍ය හා අධ්‍යාපන නිලධාරීන්
vii. සර්වෝදය දිස්ත්‍රික් ප්‍රධානී
viii. සණස දිස්ත්‍රික් ප්‍රධානී

දිස්ත්‍රික් කමිටුවල සහයෝගය ලබා ගනිමින් වී මිලදී ගැනීම් හා සහල් බෙදාහැරීම් ක්‍රියාවලිය සිදු කිරීමට යෝජනා කර ඇත. එම කාර්යය අවසන් වූ වහාම සෑම දිස්ත්‍රික්කයක් ආශ්‍රිතවම පසු විපරම ක්‍රමවේදයක් හරහා නියමිත පරිදි සමස්ථ ක්‍රියාවලිය සිදුවූයේද යන්න පරීක්ෂා කර බලා (අප්‍රේල් මස අවසන් සතිය වනවිට) එක් එක් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙතින් මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දෙන අරමුදල් නිසි පරිදි වී මිලදී ගැනීම සහ සහල් බෙදාදීමේ ක්‍රියාවලිය සඳහා යොදවන ලද බව සනාථ කිරීම මෙම කමිටුවෙන් සිදුකරනු ඇත.

3.2 <u>ප්‍රාදේශීය අධීක්ෂණ කමිටු (i)</u>

වී අස්වනු මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ලෙස නම් කර ඇති පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්/සමුපකාර වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරා විහිදී තිබෙන ගබඩා වෙත සතියකට වරක් ගොස් ස්ථානීය පරීක්ෂණ සිදුකර ලොග් සටහන් යොදවමින් වී මිලදී ගැනීම හා සහල් බවට පත් කිරීම සහ ගබඩා කිරීම නිශ්චිත කාල සටහනක් යටතේ අධීක්ෂණය සඳහා මෙම කමිටු පත්කිරීමට යෝජනා කර ඇත. මෙම කමිටු පහත නිලධාරින් අතුරින් අවම වශයෙන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු වේ.

i. ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
iv. සමෘද්ධි සහකාර කොමසාරිස්
v. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
vi. මහවැලි නේවාසික හා කලාප කළමනාකරුවන්

3.3 <u>ප්‍රාදේශීය අධීක්ෂණ කමිටුව (ii)</u>

වී මිලදී ගැනීමේ සහ වී තොග සහල් කිරීමේ වැඩසටහනට සමගාමීව අඩු ආදායම්ලාභී පවුල් නිසි ලෙස හඳුනා ගනිමින් සහල් බෙදාහැරීමේ ක්‍රියාවලියද මීට සමගාමීව සිදුවන බැවින් එම ක්‍රියාවලිය වඩාත් පාරදෘශ්‍ය අයුරින් ක්‍රියාත්මක වීම සහතික වනු පිණිස කැපවූනු ප්‍රාදේශීය මට්ටමේ කමිටුවක් ස්ථාපනය කර යුතුය. එම කමිටුව සතිපතා රැස්වී නිසි අධීක්ෂණයෙන් හා ප්‍රගති සමාලෝචනයෙන් යුතුව මාස දෙකක කාලය තුළ මෙම වැඩසටහන මැනවින් ක්‍රියාත්මක වන බව අධීක්ෂණය කළ යුතු වේ.

i. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ii. සහකාර ප්‍රාදේශීය ලේකම්
iii. නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
iv. සමෘද්ධි සංවර්ධන සහකාර අධ්‍යක්ෂ
v. සණස සමිති නිලධාරියකු
vi. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි
vii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
viii. වෙනත් සුදුසු ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය හා ප්‍රජා සංවිධානවල නියෝජිතයන්

4.0 ඉහත විස්තර කළ ආකාරයටම ජාතික කමිටුව සඳහා අංක 2.1 යටතේ යෝජිත නිලධාරින් විධිමත් පරිදි පත්කර එම නිලධාරින් සම්බන්ධ කර ගැනීමටත් අංක 3.1, 3.2 හා 3.3හි සඳහන් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් කමිටු පත්කිරීම සඳහාත් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් සහ අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් සිදුකළ යුතුය.

කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස.
3. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
4. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
6. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
7. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
9. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
10. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව - කරු.වැඩසටහන සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබාදීම සඳහා
11. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.
12. සභාපති, වී අලෙවි මණ්ඩලය - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.